(© Nekath.lk - Download By http://www.nekath.lk)

# 2019 අලුත් අවුරුදු උදාව රටට කොහොමද?

## ලෝකායත ජ්‍යොතිර්විද්‍යා අනාවැකි

තවත් නොබෝ දිනකින් බක් මහේ සූර්යය මංගල්‍යය උදාවෙයි.එහෙත් වෙනදා මෙන් සොබාදහම ඒ සඳහා සූදානම් නැතිවා වැනි ය.රට පුරා ම නියං සමයකි. දැඩි උෂ්ණසුමින් ජන ජීවිතය පීඩිත ය.මෙයට හේතුව සූර්යය රශ්මිය සමකය ආසන්නයට සෘජුව ලැබීම පමණක්ම ද? උදාවන අලුත් අවුරුද්දේ පිබිදෙන මිහිර කටුක උෂ්ණසුමින් වියැකේ ද? දහසකුත් එකක් ප්‍රශ්නාර්ථයන්ට පිළිතුරු සොයා බැලීම කාලෝචිත ය.සොබාදහමේ විද්‍යාව වූ ජ්‍යොතිෂ්‍ය අනුසාරයෙන් අප රටේ අනාගත දිශානතිය පිරික්සා බැලුමට ගත් තැතකි මේ. මෙම ලිපිය සම්පාදනයේ දී, පහත සඳහන් ජ්‍යොතිෂමය සිද්ධාන්ත ගුරුතැන්හී තබා ගතිමි.

- සූර්යය ග්‍රහණ,චන්ද්‍ර ග්‍රහණ සහ ග්‍රහ යුද්ධවල බලපෑම.
- කුම්භ ලග්න හිමි ලංකා කේන්ද්‍රය සහ ග්‍රහ චාරයේ බලපෑම.
- අලුත් අවුරුදු උදා ලග්නය සහ ග්‍රහ චාරයේ බලපෑම.

## සූර්යය ග්‍රහණ,චන්ද්‍ර ග්‍රහණ සහ ග්‍රහ යුද්ධවල බලපෑම

මේ වර්ෂය තුළ සූර්යය ග්‍රහණ ද්විත්වයක් සිදුවන අතර එයින් පළමු වැන්න,2019-01-06 වැනි දින ධනු රාශියේ පුවසල නැකතේ තෙවැනි පාදයෙන් උදාවෙයි.එය අර්ධ ග්‍රහණයකි.දෙවැන්න 2019-12- 26 වැනි දින ධනු රාශියේ මූල නැකතේ තෙවැනි පාදයෙන් උදාවෙයි.එය වලයාකාර ග්‍රහණයකි.එසේ ම 2019-01-21වැනි දින කටක රාශියේ පුෂ නැකතේ දෙවැනි පාදයෙන් සිදුවන පූර්ණ චන්ද්‍ර ග්‍රහණයකි.2019-07-17 වැනි දින ධනු රාශියේ උත්‍රසල නැකතේ ප්‍රථම පාදයෙන් තවත් ග්‍රහණයක් සිදුවේ.එය අර්ධ චන්ද්‍ර ග්‍රහණයකි.ග්‍රහණ අවස්ථාවල උදාවෙන ඒ ඒ රාශි විමසන කල ඒවා පාප ග්‍රහයින්ට ම නතුව ඇති බව පෙනෙයි.සෑම ග්‍රහණ අවස්ථාවක් ම කුජ,ශනි,රාහු,කේතු,ප්ලූටෝ,නෙප්චූන්,යුරේනස් ආදී විෂම බලයන් විසින් ආවරණය කරන මොහොතක රටේ ඉදිරි අනාගතය සුබදායක යැයි පැවසීම උගහට ය. මෙයට ම රුකුල් දෙන තවත් කරුණකි,මෙම වර්ෂයේ පවතින ග්‍රහ යුද්ධ.වර්ෂය තුළ ග්‍රහ යුද්ධ (13)ක් පමණ සිදුවන අතර ඒවායින් බහුතරයක ජය පාප ග්‍රහයින්ට ම හිමි ය.සෙනසුරු යුද්ධ හතරකුත් (4) අඟහරු යුද්ධ හතරකුත්(4) යුරේනස්,නෙප්චූන් යුද්ධ එක(1) බැගිනුත් ජය ගන්නා කල රටට කවර නම් යහපතක් ද?මෙම වර්ෂය පුරවට ම යට දැක්වෙන සංසිද්ධීන් අත්දකින්නට සිදුවනවා නොවනුමාන ය.

- රට පුරා මහජන කැලඹිලි හා මරණ ඇති වෙයි.
- ආණ්ඩුවේ ක්‍රියාකාරකම් මහජන අප්‍රසාදයට ලක්වෙයි.
- රටේ පිළිගත් නායකයින් නීතිය ඉදිරියේ වැරදිකරුවන් බවට පත්වෙයි.
- විනෝදාගාර,විද්‍යාස්ථාන,නත්‍යශාලා වැනි මහජනයා රැස්වන ස්ථානවල පිපිරීම් ඇති වෙයි.
- රටේ අධ්‍යාපන ප්‍රතිපත්තීන් අවුල් සහගත තත්වයට පත්වෙයි.
- රහස් කුමන්ත්‍රණකරුවන්ගේ ක්‍රියාකාරකම් වරින්වර කරළියට පැමිණෙයි.
- නැව් ආදී යාත්‍රාවල පිපිරීම් ද නාවික හා ජලාශ්‍රිත කටයුතුවල අනතුරු ද සිදුවෙයි.

## කුම්භ ලග්න හිමි ලංකා කේන්ද්‍රය සහ ග්‍රහ චාරයේ බලපෑම




2017-07-29 වැනි දින සිට 2020-04-11 දින දක්වා අප රට රාහු මහ දශාවේ රාහු අතුරු දශාව ගෙවමින් සිටී.රාහුගේ බලය පිළිබඳව අමුතුවෙන් කිවයුතු නැත. රාහු සතුරු වී 2017-08-17 දින සිට 2019-03-06 දින දක්වා කුම්භ රාශියේ සයවැන්න වූ කටකයට පැමිණෙයි.

(© Nekath.lk - Download By http://www.nekath.lk)

(© Nekath.lk - Download By http://www.nekath.lk)

(© Nekath.lk - Download By http://www.nekath.lk)

මෙය ලංකා කේන්ද්‍රයට ද සතුරු ස්ථානය වෙයි.2019-03-06 දින සිට 2020-09-23 දින දක්වා රාහු කුම්භ ලග්නයේ පස්වැන්න වූ මිථුනයට පැමිණෙයි. රාහුගේ බලය එසේ පවතිද්දී,කුජ-ශනී- ප්ලූටෝ-නෙප්චූන්-යුරේනස් ආදීන්ගේ ග්‍රහචාරයන්ද විමසා බැලිය යුතු ය.2019-03-22 දින කුජ කුම්භ ලග්න කේන්ද්‍රයේ සිව්වැන්න වූ වෘෂභයට පැමිණෙයි.2019-05-07 දින කුජ සතුරුව, කුම්භ ලග්න කේන්ද්‍රයේ පස්වැන්න වූ මිථුනයට පැමිණෙයි. 2019-06-22 දින කුජ කුම්භ ලග්න කේන්ද්‍රයේ සයවැන්න වූ කටකයට නීචව පැමිණෙයි. 2019-08-08 දින කුජ කුම්භ ලග්න කේන්ද්‍රයේ සත්වැන්න වූ සිංහයට පැමිණෙයි. 2019-09-24 දින කුජ සතුරුව, කුම්භ ලග්න කේන්ද්‍රයේ අටවැන්න වූ කන්‍යාවට පැමිණෙයි.එසේ ම යුරේනස් ග්‍රහයා සිව්වැන්නේ ද ප්ලූටෝ සයවැන්නේ ද නෙප්චූන් මාරක ස්ථානය වූ අටවැන්නේ ද, බොහෝ අසුබ දෘෂ්ටීන් සහිතව ගමනේ යෙදෙයි.

- රට තුළ විවිධ රෝග සහ ව්‍යසන උද්ගත වෙයි.
- රටවල් සමඟ ඇතිකර ගෙන තිබෙන බහු පාර්ශවීය ගිවිසුම් දෙදරා යන අතර ඇතැම් විදෙස් කුමන්ත්‍රණවලට ආණ්ඩුව රැවටෙයි.
- රටට එරෙහි සතුරු බලවේග, රහස් කුමන්ත්‍රණ හේතුවෙන් තැන තැන ජන සංහාරයන් සිදුවනු ඇත.
- දේශපාලකයින් කෙරෙහි මහජන අප්‍රසාදය සහ විරෝධතා වර්ධනය වෙයි.
- 2019-03-06 දිනෙන් පසු සහ 2019-08-08 දිනෙන් පසු උතුරු දේශයකින් සතුරු කරදර පැමිණෙනු ඇත.
- 2019- 09-24 දිනෙන් පසුව රාජ්‍ය මන්ත්‍රණ සහව උණුසුම් වෙයි.ගැටළු පැන නගියි.
- යුද්ධ,නාවික,වෛද්‍ය.වානේ යන ක්ෂේත්‍රවල නියුතු අයට අසුබ කාලකි.

## අලුත් අවුරුදු උදා ලග්නය සහ ග්‍රහ චාරයේ බලපෑම




2019-04-14 දින ප.ව.02.09ට සිංහල-හින්දු අලුත් අවුරුද්ද උදා වෙයි.උදා ලග්නය කටකය වන අතර කුජ,ශනි,රාහු,කේතු,ප්ලූටෝ,නෙප්චූන්,යුරේනස් ආදී ග්‍රහ පිහිටීම් ඉහත ලෙසින් ම අසුබව පිහිටා ඇත.මේ තුළින් ද අප රටේ අනාගත අඳුරු සෙවණැලි පෙන්නුම් කරයි.නෙප්චූන් මාරක ස්ථානයේ සිටීමත් යුරේනස් දස වැන්නට පිවිසීමත් කුජ එකොළොස්වැන්න සහ රාහු දොළොස්වැන්න අත්පත් කොට ගැනීමත් සුබ තත්වයක් නොවේ.උදා වූ නව වර්ෂය තුළ,

- අනපේක්ෂිත අනතුරු හා පහර දීම් වරින්වර මතුවෙයි.
- මහජන කායික-මානසික සෞඛ්‍යය පිරිහෙයි.ව්‍යාකූල සමාජ පසුබිමක් නිර්මාණය වෙයි.
- විපරීත කාලගුණික-දේශගුණික තත්වයන් නිර්මාණය වෙයි.
- පරමාණුක සහ රසායනික ක්‍රියා මඟින් විනාශකාරී තත්වයන් උදාවෙයි.
- ඇදහිය නොහැකි පුදුම සහගත දේ තුළින් ක්ෂණික මරණ බහුල වෙයි.
- ඇතැම් පරමාදර්ශී පුද්ගලයින්ගේ විෂම ක්‍රියා හෙළිවෙයි.
- අධ්‍යාපනය කෙරෙහි අසුබ තත්වයන් බල පැවැත්වෙයි.

උදාවන නව වර්ෂය සුබ තත්වයන් අල්ප වූ අසුබ බහුල කාලසීමාවක් බැව් සිහිතබා ගැනීම මැනවි.නිරතුරු නුවණැසින් සහ ඉවසීමෙන් ආගමානුකූල දිවිපෙවතක් ගතකිරීම යහපති.

**උපුල් දොඹේපොල**
**පුරාණ අන්තරීක්ෂවිද්‍යා ගවේෂක**
**071-9497975 / 076- 5397975 / 045-4550648**

(© Nekath.lk - Download By http://www.nekath.lk)

(© Nekath.lk - Download By http://www.nekath.lk)